# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................... | දිනය<br>திகதி<br>Date | 2021.02.03 |
|---|---|---|---|---|---|

සියළුම සමෘද්ධි බැංකු සමිති විධායක කමිටු/ බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජා මූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන් ,

**<u>සමෘද්ධි බැංකු/ බැංකු සමිති මඟින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම යටතේ ණය මුදල් ලබාගෙන ඇති පිටහිටි ණයකරුවන්ට සහන සැලසීම</u>**

කෝවිඩ් - 19 වෛරසය වසංගත තත්ත්වය හේතු කරගෙන තම ජීවනෝපාය කටයුතු අහිමිවීම හෝ ආදායම අඩුවීම හේතු කරගෙන ලබාගත් ණය මුදල් ආපසු ගෙවීමට අසීරුතාවයකට පත් වූ ණයකරුවන්ට 2020/14 ට පළමු එකතුවේ මඟින් ලබාදුන් සහනය තවදුරටත් ලබාදීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩල තීරණ අංක 2021/79/09 අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව, නිරෝධායන පොලිස් ඇඳිරි නීතිය සහ සංචරණ සීමාවන් පනවා ඇති ප්‍රදේශවල ණයකරුවන්ට පමණක් නොව දිවයින පුරා සියළුම පිටහිටි ණයකරුවන් ගෙන් ද මාසිකව ණය මුදල් ගෙවීමේදී අය කරන 5% දඩ පොලිය අය නොකරන ලෙස දන්වමි.

03. මෙහිදී පැහැර හරින ණයකරුවන් ද, ණය මුදල් ආපසු ගෙවීමට ඉදිරිපත් වනවිට මෙම සහන ලබාදිය හැක.

04. මෙම සහනය 2021.03.31 දිනෙන් අවසන් වන පළමු කාර්තුවට පමණක් වලංගු වේ. තවද ණයකරුවන් පුද්ගලිකව සහනය ඉල්ලීම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, ඉන් අනතුරුව බැංකු කළමනාකරු එහි සත්‍ය භාවය සනාථ කරගෙන සහනය ලබාදීම සිදු කරන ලෙස ද දන්වමි.

05. මෙම සහනය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල ණය මුදල් සඳහා වලංගු නොවේ.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම්,සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස. සහ අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස.
6. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන් , දිස්ත්‍රික් ලේකම් කාර්යාල - අ.ක.ස.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |